# රියෝකාන්, ලාල් හෑගොඩ සහ මම

මා සුමිතුරු ලාල් හෑගොඩ කිවිඳුන් මාහමු වීමට පැමිණි අවස්ථාවක අප දෙදෙනා සරළ බවේ සුන්දරත්වය ගැන කථා කරමින් සිටියා. මහගම සේකරයන්ගේ රිද්මය පිළිබඳව ද අප කතා කළා. එහි දීයි මා ඔහුට රියෝකාන්ගේ කථාව කීවේ.

ඉතා පොහොසත් කෙනෙකු වූ රියෝකාන් තමා සතු සියලු වස්තුව හැර දමා ගොස් මහණ වුණා. ඔහු මහණ දම් පිරුවේ කඳු මුදුනක පිහිටි ගල් ගුහාවකයි. පෙර ඔහුගේ වත්කම් ගැන අසා තිබුණු හොරෙක් සිතුවේ කුමක් හෝ වටිනා වස්තුවක් ගුහාවේ සඟවා ගෙන ඇති වගයි. රියෝකාන් නැති අවසරයක් බලා ගුහාවට ඔහු පිවිසියේ එය සොරා ගැන්මටයි.

ගල් පෙරලමින් ඔහු එය සොයනා අතරතුර රියෝකාන් ගුහාවට ඇතුළු වුණා.

තමාගෙන් යමක් ලබා ගැන්මට පැමිණි සොරාට දෙන්නට වෙනත් දෙයක් නැති හෙයින් ඔහු හැඳ සිටි සළුව උනා දුන්නා. සොරාට දුකයි ඊට වඩා වටිනා දෙයක් නොලැබීම ගැන. රියෝකාන්ට දුකයි ඊට වඩා වටිනා දෙයක් දෙන්නට නොතිබීම ගැන.

රාත්‍රියේ සඳ මෝදුවන විට පරිසරය සඳ රැසින් නැහැවී සුන්දර වූ විට තවුසාට නැවත දුක හිතුනා. කෙතරම් පොහොසත් ද මා ? කෙතරම් වටී ද මේ සොඳුරු රාත්‍රිය ? "අනේ ඒ සතුට සොරාට දන් දෙන්නට තිබුණා නම් !"

පසු දිනම ලාල් මට ඔහු ලියූ කවියක් ලැබෙන්නට සැලැස්වූවා.

**සත්පුරුෂයාණෝ**

සත්පුරුෂයාණෝ
සෙමෙන් කුටියට ඇතුළු වන්නෝ
සැගව සිටි
තියුණු අවි දැරෑ සොරු
ඉල්ලිය වස්තුව උහුගෙන්
රතැසින්

හදක් මෙන් නික්ලේශ වූ
නොවූයෙන් වස්තුවක් කුටියෙහි
ඉල්ලීම සපුරනු සොරුගේ
පුද කළහ හැඳිවත ගලවා

'තබාගෙන මේ ගොමස්කඩ
දෙව හස්තසාර වස්තුව' යි
කීය නොතින් සොරු නැවතත්

සත්පුරුෂයාණෝ නිරුවතින්
නගිත් නිහඬ ව

අසබඩ ගල් තලාවට
දිය හැකි නම් මේ සඳ
සොරූ තුටුවනු ඇතැයි සිතුවෝ
සඳ රැසින් නැහැවී

ගෙනෙනු ව සඳ පහළට
මහා සිත් බලයක් මවා
දෑත දිගු කොට තැත් දැරූ විට දිටී

කැටපතක් තබා එහි
කවුද සඳ සොරකම් කරන්

(මේ කව ලාල් හෑගොඩගේ "මෙ කව මෙතනින් නවතමි" කෘතියේ අඩංගුය)

ලාල්ගේ සොඳුරු කවි සිතට දැනුණු අපූර්ව චමත්කාරය කවියෙන් මනාව හෙලි වෙයි. මා නුදුටු බොහෝ දේ ද ඔහු දැක තිබේ. එහෙත් ඔහු නොදුටු යමක් මා ද දුටු බව ම සිත කීවා. මේ කතාවෙන් මා දුටු දේ කියන්නටම ඕනෑ යයි මගේ සිත බොහෝ කල් මා පෙළඹවූවා.

මගේ ප්‍රිය බිරිඳ නාලිනි සමඟ මම දිනක් මේ කතාව කීවා. කතාව අසා ගෙන සිටි ඇය කීවා "තවුසාට දන් දීමට අවශ්‍ය වුනේ භව බෝග සම්පත් නොවේ. සිතේ සතුටමයි කියා."

'සතුට' කව මා අතින් ලියවුනේ එලෙසයි.

<u>සතුට</u>

නිකෙලෙස් තවුස් උතුමෝ,

හිඳිති කඳු මුදුන, ගල් තලාව මත,

දැඩි සීතල රැයේ,

නිරුවතින්.

එදින පෙරයම,

සොරූ පිවිසියේ ගල් කුලට,

සුදුසු අවසරය දැක, තවුසා පිටව ගිය කල කුටියෙන්,

සඟවා ඇතැයි වටිනා යමක්,

එය සොරා ගැනුමට.

කෙලෙසින් ද කිසිවෙක්, බොහෝ සම්පත් දැරූ,

සියලු දේ දන් දෙනුයේ,
පැවිදි වීම උදෙසා වත් ?

තවුසා පිවිසියේ කුටියට,
තමන් කිස නිම කොට.
හොරා තවමත් සිටියි,
සොයමින් වස්තුව,
කිසිවක් සොයා ගත නොහැකිව,
හිස් කුටිය තුල.

කලබල වී සොරා,
පැන යා ගත නොහී.

තවුසා නම් නිසැකව,
දඬුවම් දෙනු ඇත කළ වරදට.
තවුස් දම් පිරුවද දැන්,
මහ තෙදැතියෙකි ඔහු පෙර.

තවුසානෝ සිතන්නෝ,
මේ දිළිඳු මිනිසා,
මා සොයා පැමිණියේ,
මගෙන් පිහිටක් පතා.

සොරකු වුවද ඔහු,
කෙසේද යන්නට දෙන්නේ,
හිස් අතින්, නොදී කිසිවක් ?

දෙන්නට කිසිත් නැති තැන,
උනා දන් දුන්නේය ඇඳි සළුව.

සත් පුරුෂයානෝ,
හිඳී ගල් කුල මත නිරුවතින්.
පුරා සඳ මතු වූයේ,

හාත් පස එකළු කරමින්,
පරිසරය නහවමින් සඳ කැළුමින්.

කෙතරම් පොහොසත් ද මා,
වස්තුව කිසිත් නැති වුව ?
මහාර්ඝ වස්තුව නම්,
සිතේ සතුටම වන්නේ ය.

"අනේ ඒ සොරුට හට,
දෙන්නට හැකි වුනා නම් මට,
මා සතු ඒ මහා වස්තුව, "

දැන් දෙමි මම සතුට,
නිසැකවම මතු දිනයක.

*සෝමබන්ධු කොඩිකාර*
*25.05.2018*